**CORGI Registered Central Heating Engineer**
**Reliable, friendly. Any work not too small**
කුඩා හෝ මහා පරිමාණයේ හෝ ඕනෑම
සෙන්ට්‍රල් හීටිං කාර්යයක් සඳහා විමසන්න.
දක්ෂ, එමෙන්ම විශ්වාසවන්ත සේවය
**නාමල් Namal - 0 7 9 5 8 7 2 0 9 1 2**

**Domestic Part P & BS7671 Qualified**
**Professional Electrical Engineer**
**All electrical work carried out**
**Testing-Inspecting and Certification of all work**
**All jobs undertaken with guarentee**
ගෘහස්ත සියළු විදුලි කාර්මික කටයුතු සඳහා
ප්‍රවීන විදුලි ඉන්ජිනේරු ශිල්පී සේවය
**Call - රන්ජිත් Ranjith on 07904174241**

**ලිහිණියා LIHINIYA**
**ශ්‍රීලංකා අවන්හල සහ වෙළඳසල**
**වසර 20 ක අඛණ්ඩ මිත්‍රශීලී සේවය**
කුළුබඩු වර්ග ඇතුළු විවිධ ශ්‍රීලංකා නිශ්පාදන
***ප්‍රණීත ආහාර සැපයීමේ පුරෝගාමියෝ***
එවලේම පිලියෙල කරන ආප්ප, ඉඳිආප්ප
පිට්ටු, රොටි කොත්තු, බුරියානි
***උත්සව සඳහා ඇණවුම් බාරගනු ලැබේ.***
**Tel. 0208 450 9052**
**66 Cricklewood Broadway, London NW2 3EP**

## වයිප් හොයන හැටි

ඒ ටවුමේ විශාල සුපර්මාර්කට් එකකට ගිය මිනිසෙක් ඒ තුළ සිටි ලස්සන තරුණියක් ළඟ නැවතී මෙසේ කීවේ ය.

" මේ නෝනා.. මට පොඩි උදව්වක් කරන්න. මගේ වයිප් මාත් එක්ක ආවා. එයා හිටි ගමන් මේක ඇතුළෙ අතුරු දහන් වුණා. මට දැන් එයාව හොයා ගන්න බෑ.....මට පුළුවන්ද ඔයත් එක්ක ටිකක් කතා කර කර ඉන්න....? "

" ඒ මොකටද....?" තරුණිය ඇසුවාය.

" මම ලස්සන ගෑණු කෙනෙක් එක්ක කතා කළොත් අපේ වයිෆ්ප් කොහේ හිටියත් එතනට දුවගෙන එනවා.."

## ඒකත් නරක නෑ

උසාවියේ ඇසුණු නඩුව කදී නඩුකාරයා චූදිතයාගෙන් මෙසේ ඇසී ය.

" තමා මේ හොරකම කරන්නට ඇතියි සිතන විදියේ සැළැස්මක් පැමිණිල්ලේ නීතිඥවරයා ඉදිරිපත් කළා. ඇත්තටම තමා ඒ හොරකම කළේ ඒ ආකාරයටමද? "

" නෑ හාමුදුරුවනේ ඒ විදියට නෙවෙයි... ඒත් ඒ විදිය වුනත් නරක නෑ..."

**වසර ගණනාවක් පුරා ශ්‍රීලාංකික ජනතාවගේ හදවතට**
**වඩාත් සමීපව කටයුතු කරන නැව් බඩු ආයතනයයි**
**සත්සමුදුර ජයගත් ට්‍රයිකෝ**
♦ ට්‍රයිකෝ - කොළඹ
50 සිරිල් සී පෙරේරා මාවත
කොළඹ 13
**දුරකතනය 4 4 8 2 7 0 / 4 3 2 2 3 6**
♦ ට්‍රයිකෝ - ගාල්ල ♦ ට්‍රයිකෝ - කුරුණෑගල
**සතියක් ඇර සතියක්, එනම් මසකට දෙවරක්**
**ට්‍රයිකෝ නැව්බඩු ලංකාවට යැවේ.**
**දින 17 කින් ඒවා ලංකාවට ළඟාවේ.**
**TRICO**
**Shipping & Forwarding Ltd**
**555 White Hart Lane**
**London N17 7RP**
**Telephone 0 2 0 8 8 8 8 8 7 8 7**
**Fax 0 2 0 8 8 8 9 5 4 4 5**
**E-Mail : trico@tricoshipping.com**
***නැව්බඩු සඳහා පූර්ණ විශ්වාසය තැබිය හැකි ආයතනය***



## අමතක නොවුණු කුඩේ

කරෝලිස් මාමාට වයස්ගතවීම නිසා සාමාන්‍යයෙන් බොහෝ දෙනෙකුට ඇතිවන අමතකවීමේ රෝගය ඇත. එක අතකට කීවහොත් ඒ අමතකවීම ඒ වයසේ අයට වඩා ඉතා වැඩිවී ඇති බව පසුව තේරුණි. ඔහුගේ බිරිඳ වන ගිමාරා නැන්දා කරෝලිස් මාමා කොහේ යතත් හැම දෙයක්ම හිතා බලා පරිස්සමෙන් කරන්නට උපදෙස් දෙයි. එසේම මාමා ගෙන යන බඩු, කුඩය, සෙරෙප්පු දෙක, පරණ හම්බෑග් එක ගැන මතක තියා ගන්නා ලෙසද නිතර කියයි. ඔහු ගෙදරින් පිටවී ඇතට නොපෙනී යන තුරුම ඇය හඬ නගා ඒවා ඔහුට මතක් කරයි. තමාගේ අමතකවීමේ ලෙඩේ ගැන කරෝලිස් මාමා ද හොඳින් දනී.

දිනක් ගමනක් ගොස් මාමා ආවේ සිනාමුසු මුහුණිනි. ඔහු ගිමාරා නැන්දාට අඬගැසුවේය.

" ඔන්න බොලන් මට අද කිසි දෙයක් අමතක වුණේ නැහැ..... ඔන්න මං ගෙනිච්ච කුඩේ ආපහු ගෙනාවා....."

එවිට එළියට පැමිණි නැන්දා මෙසේ කීවාය.

" මොන කුඩේද? ඔහේ අද කුඩයක් ගෙනිච්චෙ නෑ... නෙව....."

## මුදලාලිගේ ගණන් හැදිල්ල

තරුණයන් හය දෙනෙක් වේගයෙන් දුවගෙන විත් නගරයේ වූ වෙළඳසල වෙත ගියේ හති අරිමිනි. දුව ආ එක් තරුණයෙක් කඩ හිමියාට මෙසේ කීවේ ය.

**තරුණයා :** මුදලාලි අපට හරිම මහන්සියි..... හරිම තිබහයි.... ඉක්මනට අපට බොන්න මොකවත් දෙන්න....අපි මේ හැතැප්ම 24ක් විතර දුරක් දුවගෙනයි එන්නෙ....

**මුදලාලි :** අයියෝ... ඕකත් මහ ලොකු වැඩක්ද...? හැතැප්ම 24 ක් හයෙන් බෙදුවම එක්කෙනෙකුට වැටෙන්නෙ හැතැප්ම හතරයි නේ.

## වෙනස

ළමයෙකු ඉපදුණු විට දරුවාගේ පළමුවෙනි මාස දහඅට දෙමාපියෝ ඒ දරුවාට කතා කරවන්නට ද ඇවිද්දවන්නටද දිරිගන්වති.

ඊළඟ මාස දහඅට ඒ දෙමාපියන් ගතකරන්නේ ඒ දරුවාට..... " කට වහපන්..... සද්ද නැතුව හිටපන්.... නැගිටින්නෙ නෑ.... කොහෙද යන්නෙ?.... ඔහොම වාඩිවෙලා එකතැනක හිටපන්....." යනුවෙන් කියමිනි.

## මම මොනවා කියන්නද?

රෝලන්ඩ් දිනක් තම පියා වෙත ගොස් මෙසේ කීවේය.

" තාත්තෙ මම කසාද බඳින්නයි යන්නෙ.... මට අපේ අම්ම වගේම කාන්තාවක් හම්බ වුණා.... "

එවිට රෝලන්ඩ්ගේ පියා මෙසේ කීවේය.

" පුතා මොනවද උඹ මේ මොහොතේ මගෙන් බලාපොරොත්තු වෙන්නෙ...? මගේ ප්‍රීතිය ප්‍රකාශ කිරීමද.....? මගේ කණගාටුව පළකිරීමද....? "

## කෑගහන කාරණේ

පියදාස දතක් ගලවන්නට රෝහළට ගියේය. දත් දොස්තර ළඟට කිට්ටු වූ විට පියදාස මහ හයියෙන් කෑ ගැසීය.

**දොස්තර:** මොකද ඕයි මේ බෙරිහන් දෙන්නෙ....? තවම අඬුව කට ඇතුළට දැම්මෙවත් නෑ....

**පියදාස:** මහත්තෙයා මගේ කකුල පාගගෙන නේ ඉන්නෙ

## මෙහෙමත් කේක්

බේකරියකින් කේක් ගෙඩියක් මිළට ගෙනගිය කාන්තාවක් එය රැගෙන ආපසු බේකරියට ආවා ය.

" මුදලාලි මේ කේක්එක හරි නෑ නේ.."

" නෝනා අපිට එහෙම චෝදනා කරන්න එපා.... අපි කේක් හදන්නෙ අවුරුදු 88 කට කලින් ඉඳලයි...."

" හැදුවට කමක් නෑ මුදලාලි..... ඒවා දැන් විකුණන එකනේ හොඳ නැත්තෙ....."

Community Legal Service
**ANTONS**
***SOLICITORS***
**Community Legal Service**
**For Quality Services**
We offer a comprehensive range of Legal Services.

Conveyancing
- Sale & Purchase
- Right to buy (Council House)
- Re-Mortgage
- Assignment of Lease
- New Lease
- Licensing Applications
- Contractual Disputes

Immigration
- Asylum cases
- Asylum Application
- Judicial Reviews
- Extensions of Visas
- Marriage Applications
- Work Permits
- Business Visas

*For a fee of £299 for Residential, £599 for Commercial excluding vat & disbursement*

***Contact -*** **Mrs Rani Bulathwela 0 7 8 0 8 1 5 8 3 6 0**
**Rohitha – 0 7 9 5 6 5 4 9 4 4 7 Nihal – 0 7 9 3 0 3 1 0 9 6 7**
**Vajira – 0 7 8 8 7 8 4 0 2 2 7**
**ANTONS SOLICITORS**
**14 Wordsworth House, Wordsworth Parade**
**London N8 0SJ**
Tel. 0208 888 6211 Fax 0208 888 1403
***E-mail :*** **antons.solicitors@btopenworld.com**



# Woman married 23 times
# 23 වතාවක් විවාහවූ කතක්

**by Carrie Stetler / The Star-Ledger**

Linda Wolfe of Indiana, USA has been married 23 times, which earns her the title of most -married woman in the Guinness Book of World.

And she's only 68! That's an average of, what, one husband every three years ? Wolfe had seven kids by her first three husbands. That means they had had twenty step dads. Why aren't they in the Guiness book of World Records ?

How did her children turn out? One of her daughters has been married three times (so far), another was a lingerie model. A son is in prison. Most of them don't visit anymore.

Understandably, the one who's talking sounds bitter. ("It was hard to grow up with. We were made fun of when we were in school.")

Linda Wolfe has been single since 1996 and admits her last wedding was a publicity stunt. But she wouldn't mind tying the knot again. Her husband's include a 31-year-old Baptist minister, who she married at 16, two gay men, a homeless guy and a convict accused of rape.

ඇමරිකාවේ ඉන්ඩියානාහි වෙසෙන ලින්ඩා වුල්ෆ් නම් කාන්තාව 23 වතාවක් විවාහ වූ කෙනෙකි. දැන් ඇය ලොව වැඩිම වාර ගණනක් විවාහ වූ කාන්තාව ලෙස ගිනස් ලෝක වාර්තා පොතට ඇතුල්ව සිටී. ඇයගේ දැනට වයස 68 කි. ඒ අනුව බැලුවහොත් ලින්ඩා සෑම වසර තුනකට වරක් සැමියෙකු ලබා ඇත. එසේම ඇයට මුල් විවාහ තුනෙන් ලැබුණු දරුවන් හත් දෙනෙකු ද ඇත. ඒ දරුවන්ට බාප්පලා විසි දෙනෙක් සිටිති. එයත් ගිනස් වාර්තාවක් නොවේද?

ලින්ඩාගේ එක් දියණියක් දැනට තුන්වරක් විවාහ වී ඇත. තවත් දියණියක් විලාසිතා නිරූපිකාවකි. පුතෙක් හිරේට ගොසින්ය. ළමයින් හත් දෙනාගෙන් වැඩි පිරිසක් මව බලන්නට නොඑති. ඇය හා සම්බන්ධකමක් ඔවුන්ගේ නැත. ඒ ළමයි කියන්නේ ඉස්කෝලේ යන කාලයේ ඔවුන් මවගේ කසාද බැඳීම් නිසා අනෙක් ළමයින්ගේ සමච්චලයට ලක්වූ බවය.

ලින්ඩා වුල්ෆ් 1996 සිට තනිකඩව සිටී. අවසාන කසාද බැඳීම සගරාවක පෙනී සිටීම සඳහා කළ මුදල් ලැබූ ප්‍රචාරක වැඩකි. නැවතත් විවාහයක් කරගැන්මට ඇයට අකමැත්තක්ද නැත. ඇයගේ සැමියන් අතර විවිධ අය සිටිති. ප්‍රථම සැමියා ක්‍රිස්තියානි බැප්ටිස් නිකායේ පූජකවරයෙකි. තවත් සැමියෙක් ස්ත්‍රී දූෂණයට හිරේගිය අපරාධකාරයෙකි.